# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2002 අංක 22 දරන පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය පනත

---

**[සහතිකය සටහන් කළේ 2002 ඔක්තෝබර් මස 04 වන දින.]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2002 ඔක්තෝබර් මස 04 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 6.75 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

# 2002 අංක 22 දරන පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය පනත

[සහතිකය සටහන් කළේ 2002 ඔක්තෝබර් මස 04 වන දින]

එල්. ඩී.–ඕ. 48/2002.

**අධ්‍යයන කටයුතු සහ පර්යේෂණ පහසුකරලීම සඳහා ආධාර සැපයීම මගින් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් අධ්‍යාපනික ප්‍රගතිය ප්‍රවර්ධනය කරනු ලැබීම පිණිස ද, ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම පරිපාලනය කිරීම සඳහා පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලයක් පිහිටුවීම පිණිස ද සහ ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු ද සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 2002 අංක 22 දරන පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. මේ පනතේ කාර්ය සඳහා, (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු අතර, මේ පනත පරිපාලනය කිරීම සහ මේ පනත මගින් මණ්ඩලය වෙත ලබා දී ඇති හෝ පවරා දී ඇති බලතල ක්‍රියාත්මක කිරීමත් කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමත් මණ්ඩලයේ කාර්ය භාරය වන්නේ ය. පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය පිහිටුවීම.

3. (1) අධ්‍යයන, පර්යේෂණ, උපදේශක සේවා සහ වෙනත් අධ්‍යාපනික කටයුතු සඳහා මුදල් සැපයීමෙන් සහ – පනතේ අරමුණු.

(අ) ශ්‍රී ලංකාවෙහි උසස් අධ්‍යාපනය හදාරන ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට විදේශීය උසස් අධ්‍යාපන ආයතනවලට යාම පිණිස ; සහ

(ආ) විදේශීය රටවල පුරවැසියන්ට ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතනවල උසස් අධ්‍යාපනය හැදෑරීම ද පිණිස

විධිවිධාන සැලසීමද මගින් උසස් අධ්‍යාපන හුවමාරු සඳහා ඉඩ සැලසීමෙන් අධ්‍යාපනයේ ප්‍රගතිය උදෙසා ජාත්‍යන්තර සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම, පනතේ අරමුණු වන්නේ ය.

(2) (1) වන උපවගන්තියෙහි දක්වා ඇති පනතේ අරමුණු මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

අධ්‍යයන ක්ෂේත්‍ර නිශ්චය කිරීමේ ක්‍රමය.

**4.** (1) පශ්චාත් උපාධි ප්‍රදාන සිදු කරනු ලැබිය හැකි වන්නේ යම් අධ්‍යයන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ද, එම අධ්‍යයන ක්ෂේත්‍ර අග්‍රාමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබ පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් අනුමත කරනු ලැබිය යුතු ය. ඒ යෝජනා සම්මතය, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුකූලව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) අග්‍රාමාත්‍යවරයා විසින්, කථානායකවරයා, විපක්ෂනායක වරයා සහ මණ්ඩලයේ සභාපතිවරයා විමසීමෙන් පසු වාර්ෂිකව ප්‍රදානය කරනු ලබන ශිෂ්‍යත්ව ප්‍රමාණය සහ ඒ ඒ ප්‍රදාන කිරීම් සඳහා අවශ්‍ය වන අරමුදල් පිළිබඳ ඇස්තමේන්තුවක් නිශ්චය කළ යුතු අතර (1) වන උපවගන්තියෙහි සඳහන් යෝජනා සම්මතයෙහි එය ඇතුළත් කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සංයුතිය ආදිය.

**5.** (1) මණ්ඩලය –

(අ) ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත, කථානායකවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනකුගෙන් (ඉන් එක් අයකු කාන්තාවක් විය යුතු ය) ;

(ආ) උපකුලපතිවරුන් විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකුගෙන් ; සහ

(ඇ) උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන්,

සමන්විත විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයන්ගෙන් එක් සාමාජිකයකු මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් අග්‍රාමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයට ලේකම්වරයකු සිටිය යුතු අතර ඔහු මණ්ඩලයේ ප්‍රධාන පරිපාලන නිලධරයා විය යුතු ය. තවද මණ්ඩලයේ සියලු තීරණ ක්‍රියාත්මක කිරීම සහ මණ්ඩලය විසින් ලේකම්වරයා වෙත පවරනු ලබන හෝ මේ පනත මගින් හෝ මේ පනත යටතේ පවරනු ලැබ ඇති හෝ වෙන් කර දී ඇති යම් බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම ද, ලේකම්වරයාගේ වගකීම වන්නේ ය.

(4) සභාපතිවරයාගේ සහ (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද යටතේ පත් කරනු ලබන සාමාජිකයන්ගේ ධූර කාලය, ඔවුන්ගේ පත්වීමේ දින සිට ගණන් බලනු ලබන අවුරුදු තුනක කාලයක් විය යුතු ය.

(5) ඉහත නිශ්චිතව දක්වා ඇති ධූර කාලය අවසන් වීමට පෙර, කථානායකවරයා විසින්, ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත, තත් කාර්ය සඳහා හේතු දක්වා, සභාපතිවරයා හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(6) (2) වන උපවගන්තිය ප්‍රකාරව ධූරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් මිස, සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස නැවත පත්කිරීම සඳහා සභාපතිවරයා හෝ යම් සාමාජිකයකු සුදුස්සකු විය යුතු ය.

(7) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ පාරිශ්‍රමික සහ දීමනා සභාපතිවරයාට සහ සාමාජිකයන්ට ගෙවනු ලැබිය යුතු ය.

(8) මණ්ඩලයේ සංයුතියෙහි යම් පුරප්පාඩුවක් තිබීම නොතකා මණ්ඩලයට ක්‍රියා කළහැකි අතර ඒ අනුව මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීම හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු පත්කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීම නිසාම පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ තීරණයක් බලරහිත නොවිය යුතු ය.

(9) මණ්ඩලයේ කටයුතු කරගෙන යාමේ දී සහ මණ්ඩලයේ රැස්වීම් පවත්වාගෙන යාමේ දී අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය නියම කරනු ලබන පරිදි විය යුතු ය.

6. මණ්ඩලයට පහත සඳහන් බලතල තිබිය යුතු ය:– මණ්ඩලයේ බලතල.

(අ) මේ පනත මගින් මණ්ඩලයට පවරා ඇති හෝ වෙන්කර දී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම ;

(ආ) ශ්‍රී ලංකාවේ පිහිටි විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි පිරිනමනු ලබන ආයතනයකින් ස්වකීය පළමුවන උපාධිය ලබාගත් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව පිරිනැමීම ;

(ඈ) විදේශයක පිහිටි විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි පිරිනමනු ලබන ආයතනයකින් ස්වකීය පළමුවන උපාධිය ලබාගත් විදේශීය රටවල ශිෂ්‍යයන්ට පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව පිරිනැමීම ;

(ඇ) මේ පනත යටතේ ප්‍රදාන දෙනු ලැබ ඇති තැනැත්තන්ට, අවධාරණ වැඩමුළු සහ භාෂා පුහුණුවීමේ පාඨමාලා පැවැත්වීම ;

(ඉ) ප්‍රදානලාභී දේශීය හෝ විදේශීය ශිෂ්‍යයන්හට ඔවුන්ගේ නිවෙස්වල සිට ගමනාගමන පහසුකම් සැලසීම සඳහා වියදම් ඇතුළුව වෙනත් සේවා, මණ්ඩලයේ අරමුදලින් සැපයීම ;

(ඊ) එකී ක්‍රියා පිළිවෙලෙහි ඵලදායීතාව වැඩිකිරීම සඳහා සෑම ප්‍රදානයක්ම කලින් කල ඇගයීම ; සහ

(උ) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ද කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීම සඳහා ද අවශ්‍ය විය හැකි හෝ ආනුෂංගික වන වෙනත් සියලු ක්‍රියා සිදු කිරීම.

ප්‍රදාන, ගිවිසුම් හෝ එකඟතා ගිවිසුම් මගින් සිදුකිරීම.

7. (1) මණ්ඩලය විසින් පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව පිරිනැමීම ප්‍රදාන මගින් සිදුවිය යුතු ය. ඒ ප්‍රදානවල නියම සහ කොන්දේසි, මණ්ඩලය සහ ප්‍රදානලාභී අතර ඇති කර ගනු ලබන ගිවිසුමක හෝ එකඟතා ගිවිසුමක ඇතුළත් කරනු ලැබිය යුතු ය. එකී ගිවිසුමක හෝ එකඟතා ගිවිසුමක ඇතුළත් කළයුතු කරුණු නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(2) ශිෂ්‍යත්ව පිරිනැමීමේ දී මණ්ඩලය විසින් අනුගමනය කළයුතු උපමාන, අග්‍රාමාත්‍යවරයා, කථානායකවරයා සහ විපක්ෂනායකවරයා විමසා තීරණය කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන ප්‍රදානයක, මුදල් විෂයය අමාත්‍යවරයා විමසා මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි, අමතර ඉගැන්වීම් ගාස්තු, ගමන් වියදම්, විසුම් ඉඩ ගාස්තු සහ දෛනික සංයුක්ත දීමනා ප්‍රමාණ සහ යම් හදිසි වෛද්‍ය වියදම් ඇතුළුව සෞඛ්‍ය සහ අනතුරු රක්ෂණය ද ඇතුළත් විය යුතු ය.

(4) අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමේ නියුක්තව සිටිය දී යම් ප්‍රදානලාභියකු මියගිය හොත්, ඒ තැනැත්තාගේ මෘතදේහය, ඔහුගේ නිවසට ප්‍රවාහනය කිරීමේ වියදම් මණ්ඩලය විසින් දැරිය යුතු ය.

(5) ප්‍රදානලාභියකුට දැරීමට සිදුවන වෙනත් යම් අනපේක්ෂිත වියදමක් ගෙවන ලෙස ඔහු විසින් ඉල්ලා සිටි විට, ඒ ඉල්ලීම සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් ඔප්පු කිරීමේ සාක්ෂි මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමේ දී, මණ්ඩලය විසින් ඒ ඉල්ලීම අනුමත කරනු ලැබිය හැකි ය.

**8.** මණ්ඩලයට අරමුදලක් තිබිය යුතු අතර ශිෂ්‍යත්ව පිරිනැමීමට අදාළ සියලු වියදම් එම අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය: මණ්ඩලයේ අරමුදල.

තවද ඒ අරමුදලට –

(අ) මේ පනතේ කාර්ය සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද සියලු මුදල් ;

(ආ) මණ්ඩලය වෙත ලැබෙන සියලු විදේශීය හෝ දේශීය ත්‍යාග සහ ප්‍රදාන ; සහ

(ඇ) මුදල් වශයෙන් ලැබෙන වෙනත් සියලු ත්‍යාග,

ගෙවිය යුතු ය.

**9.** එක් එක් වර්ෂය සඳහා පිරිනමන ලද ශිෂ්‍යත්ව සහ තත්කාර්ය සඳහා වියදම් කරනු ලැබූ අරමුදල් පිළිබඳ ප්‍රකාශයක් ඇතුළත් මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක්, මණ්ඩලය විසින් සෑම ලිත් වර්ෂයකම පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සැලැස්විය යුතු ය. මණ්ඩලයේ වාර්තාව.

**10.** (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන බලාත්මක කිරීම සඳහා සහ නියම කිරීම සඳහා මේ පනත මගින් නියමිත හෝ බලය පවරනු ලබන යම් කරුණක් සම්බන්ධයෙන් අග්‍රාමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) (1) වන උපවගන්තිය මගින් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය :–

(අ) මණ්ඩලයේ කටයුතු පවත්වාගෙන යාමේ දී සහ මණ්ඩලයේ රැස්වීම්වල දී අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය ;

(ආ) ශිෂ්‍යත්වයක් පිරිනැමීමට අදාළ යම් ගිවිසුමක හෝ එකඟතා ගිවිසුමක ඇතුළත් කළයුතු කරුණු.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගයෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි පසු දිනයක සිට බලාත්මක විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින්, අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් සිදු නොවිය යුතු ය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**11.** මේ පනතෙහි –

"ව්‍යවස්ථා සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VII අ පරිච්ඡේදය යටතේ පත් කරනු ලැබූ ව්‍යවස්ථා සභාව අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**12.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් ; එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.